## 01. හැඳින්වීම

සන්නිවේදනය සංකීර්ණ ක්‍රියාවලියක් පමණක් නොව මිනිසාගේ පැවැත්මට එකිනෙකා අතර අදහස් හුවමාරු කර ගැනීම අත්‍යාවශ්‍යම සාධකයකි. මානවයා දේශගුණික සහ කාලගුණික සාධක පමණක් නොව පාරිසරික පුහුණුවක් උපයෝගී කර ගනිමින් මුල්කාලීන ප්‍රාථමික සමාජය තුළ නිර්වාචික සන්නිවේදනයෙහි (Non Verbal Communication) නිරත විය. ස්වීය සන්නිවේදනයෙහි පමණක් නොව කණ්ඩායම් වශයෙන් සාමූහික සන්නිවේදනය තුළින්ද ප්‍රාග් ජන සමාජ අදහස් හුවමාරු කර ගැනීමේ කාර්යයෙහි නිරත විය. ක්‍රම ක්‍රමයෙන් ප්‍රාග් ජන සමාජය විකාසනය සහ තාක්ෂණික දියුණුවට පත්වෙද්දී අන්තර්වර්තී සන්නිවේදන ශෛලිය එනම්, පුද්ගලයන් දෙදෙනෙකු මුහුණට මුහුණලා සිදු කරන සන්නිවේදනය වඩාත් ප්‍රබල තත්වයකට පත් විය.

"මුවින් යමක් ප්‍රකාශ කිරීම හෙවත් වාචික ශබ්ද නිකුත් කිරීම ද කලී මිනිසාගේ මහාර්ඝ සිද්ධියක් විය. එමගින් සිය සිතිවිලි සමග අදහස් වදන් සහ යෙදුම්වලට සංකේතකරණය වී (Encoded) සම්ප්‍රේෂණය වී (Transmitted) වෙනත් කෙනෙකුගේ මනසක් වශයෙන් විසංකේතකරණය (Decoded) වීම මෙමගින් සිදුවිය.

(මහේන්ද්‍ර ප්‍රනාන්දු - සන්නිවේදන ගවේෂණ - 16 පිටුව)

අතීතයේ සන්නිවේදන තාක්ෂණය තුළ ගිලා ලිපි, ගු හඬ, පරවියන් මගින් සංදේශ යැවීම, ගිනි දැල්වීම, ඝණ්ටාර නාද කිරීම යනාදී සන්නිවේදන මාධ්‍යයන් යොදා ගැනීම සිදුවිය. ක්‍රම ක්‍රමයෙන් විකාසනය වසයේ පුළුල් වීමක් සමගම සංකේත පද්ධතියක (Symbol System) අවශ්‍යතාවය ගොඩ නැගේ. මෙකී සාධකයෙහි ප්‍රතිඵලයක් ලෙස රූප සටහන්, චිත්‍ර නිර්මාණය වේ. හෝමිය මිනිසාගේ සන්නිවේදන අවශ්‍යතාවයක් මත පරිණාමයට පත්වීමේ ප්‍රතිඵලයක් ලෙස රූප සටහන්, චිත්‍රාක්ෂර, නිර්මාණය වේ. හෝමිය මිනිසාගේ සන්නිවේදන අවශ්‍යතාවය පරිණාමයට පත්වීමේ ප්‍රතිඵලයක් ලෙසිනි.

මිනිසාගේ පරිකල්පනය ගැනීමෙහි අවශ්‍යතාවයට සමගාමීව තාක්ෂණික මෙවලම් වර්ධනය වීම දැකගත හැකිය. 1440 දී මුද්‍රණ යන්ත්‍රය සොයා ගැනීම එහි උච්චතම අවස්ථාවයි. ජන සන්නිවේදනය ජනමාධ්‍ය බවට පත් වීමත් ජනමාධ්‍ය නව මාධ්‍ය බවට පත් වීමත්, සමඟදීයාව මිනිසාගේ සන්නිවේදන අවශ්‍යතා නවමානයකට ගෙන ගොස් තිබේ

කලෙකදීම ඉතාම සෙමින් මුද්‍රණය වූ එවන් ප්‍රකාශනයක් කාලයාගේ අවෑමෙන් තාක්‍ෂණයේ දියුණුවීම අනුව අධිවේගයකට හැරී තිබේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ජන සන්නිවේදන ක්‍රියාදාමය පිටුපස සංකීර්ණ තාක්‍ෂණයක් (Complex Technology) පණ ගැන්වෙනු දැකගත හැකිවිය. ජන සන්නිවේදන ක්‍රියාදාමයේ පුළුල්වීම හා සමග එහි පරිණාමය වෙනස් දැවැන්ත බවද (Amplitude) දැකගත හැකිවිය.

(සුනන්ද මහේන්ද්‍ර, සන්නිවේදන ගවේෂණ, පිටුව 34)

අද්‍යතන සන්නිවේදන ප්‍රවේශය තුළ තොරතුරු සමාජ බලවේගයක් බවට පත්ව තිබේ. ග්‍රාහකයා ඇවිළුණු තරගක් වාණිජකරණ සන්නිවේදන රටාවක පරිණාමය සිදුවෙමින් පවතී. එහිදී සන්නිවේදන ව්‍යුහය තුළ ජනමාධ්‍ය සහ එම මාධ්‍ය තොරතුරුවලින් ග්‍රාහකයින් හැසිරවීමේ කාර්යභාරයක නිරත වේ. ආර්ථික, දේශපාලනික, සංස්කෘතික, ආගමික පදනම් තුළ ගොඩ නැගෙන මිනිසාට මාධ්‍ය මගින් නව ස්වරූපයක් ගොඩ නැංවෙමින් පවතී.

ග්‍රාහකයා ලෙස සැලකෙන මහජනතාව ස්වකීය මත (Opinions) වෙනස් කර ගැනීමටත්, සකසුරු කර ගැනීමටත් ජනමාධ්‍ය ඔස්සේ ලැබෙන අදහස් (Ideas.) තොරතුරු (Information) සන්නිවේදනය (Communication) විවරණ (Commentaries) ලෙස විශ්ලේෂණ (Analysis) මූලාශ්‍ර කර ගන්නා බවය.

(සුනන්ද මහේන්ද්‍ර - සන්නිවේදන ගවේෂණ 42 පිටුව)

වෙබ් අඩවි මෙන්ක් වන ප්‍රවෘත්ති මූලාශ්‍රයන් සඳහම් කරගෙන තොරතුරු පුපුරුවා හැරීමක් (Information Explosion) දැකගත හැකිය. මෙම සංකීර්ණ ක්‍රියාවලිය තුළ ග්‍රාහකයාට ඇතිවන බලපෑම අති මහත්ය.

"ක්‍රියාවලිය" යන සංකල්පය අප පිළිගතහොත් සිදුවීම්, සම්බන්ධතා ගතික බවත්, අඛණ්ඩ බවත් නිරන්තරව වෙනස්වන බව සලකන්නෙමු. යම්ක් ක්‍රියාවලියකැයි කී විට අප අදහස් කරන්නේ එයට ආරම්භයක්, අවසානයක් හෝ නිශ්චිත සිදුවීම් අනු පිළිවෙලක් නොමැති බවයි. ක්‍රියාවලිය චංචලය, ක්‍රියාවලියකටත් අන්තර් කියලු දෑ අන්තර් ක්‍රියාවලියක යෙදෙන්නේ එක් සාධකයක් තවත් සාධකයකටත් එම සාධකය පෙරළා අනෙක් සාධකයටත් බලපෑමෙනි.

( බර්ලෝ, 1960 - පිටුව 24

සන්නිවේදනය ක්‍රියාවලියකි. මෙම ක්‍රියාවලිය තුළ ග්‍රාහක ස්වරූපයෙහි ගතිකත්වයක් ගොඩනැගේ. ජන මාධ්‍යයෙහිම ප්‍රවණතාවයක් වන වෙබ් පුවත් ග්‍රාහක ගතකිරීම අනාගත සන්නිවේදනයෙහි ප්‍රබලතම ක්‍රියාවලියක් බවට පත්විය හැකිය. මෙම ව්‍යුහයෙහි ස්වරූපය අවබෝධ කර ගැනීම මෙම පර්යේෂණ නිබන්ධනය ගොඩ නැංවීමෙහිදී අපේක්ෂිත කරුණු බවට පත්වේ.

මානවයාගේ ශිෂ්ට විකාශනයත් සමගම වත්මන් ගෝලීයකරණ සමාජ පරිසරය තුළ තොරතුරු සමාජ බලවේගයක් බවට පත්ව තිබේ. ප්‍රාග් ජනමාධ්‍යවේදී ප්‍රපංචයක් ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වී නූතනය වනවිට ගුවන් විදුලිය, රූපවාහිනිය වැනි සන්නිවේදන ප්‍රවාහයන් පැමිණෙත්ම නූතන මාධ්‍ය බවට පත්ව සන්නිවේදන ක්‍රමවේදය වඩාත් දියුණු තත්වයකට පත්ව ඇත. එම ජනමාධ්‍යයෝ සමාජ සංවර්ධනය මෙන්ම පැවැත්ම උදෙසා තීරණාත්මක බලවේගයක් බවට පත්ව ඇත. වර්තමානයේ ජනමාධ්‍යයට අද්විතීය ස්ථානයක් හිමිව තිබෙන්නේ රටක සිව්වන බලවේගය ලෙසට තීරණාත්මක භූමිකාවක් නිරූපණය කිරීම නිසාවෙනි.

ජනමාධ්‍ය තුළින් තොරතුරු හුවමාරු කර ගැනීමේ අවකාශය ඉදිරියට පැමිණෙත්ම, ප්‍රවෘත්තිවලට වටිනාකමක් නිර්මාණය වෙත්ම නව මාධ්‍යයෙහි ආගමනය සිදුවේ. වර්තමාන සන්නිවේදනයට නව මුහුණුවරක්, නව අර්ථකථනයක් නව මානයක් ලෙස පැමිණි නව මාධ්‍ය හරහා සමාජ පද්ධතිය විවිධ චලනයන්ට ලක් කෙරේ. ප්‍රතිසම (Analog) තාක්ෂණයෙන් වෙනස්ව Digital Revolution යුගයට පැමිණීමත් සිදුවේ. මේ නිසා නව මාධ්‍ය විවිධ සංරචකයන් එකතු කර ගනිමින් වෙනස් වෙමින් ව්‍යාප්ත වීම දක්නට ලැබේ. ජනමාධ්‍ය තුළින් ජන සන්නිවේදනයක් සිදු කරනු ලැබුවද නව මාධ්‍ය ඒක පුද්ගල සන්නිවේදනය සිදු කිරීමෙහි ප්‍රවණතාවය දැකගත හැකිය.

- "නව මාධ්‍ය යනු එතෙක් පැවති ජනමාධ්‍යයන් මැද්දට පරිගණක අන්තර්ජාලයේ කඩා වැදීම මගින් සිදු කර තිබෙන මහා වෙනසයි."

(පරණවිතාන කරු - සිවුවෙනි ආණ්ඩුවේ දේශපාලනය)